**සී/ස මාන්තායි සෝල්ට් සමාගම - 2015/2016**

-----------------------------------------------------

2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සී/ස මාන්තායි සෝල්ට් සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර සමාගමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ කාර්යසාධනය පිළිබඳව මගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය")වගකීම වේ.

## 1.3 **විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

(අ) පොලී ආදායම් රු.201,470 කින් අඩුවෙන් දක්වා තිබූ අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය ද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) විකුණා තිබූ නමුත් ගනුදෙනුකරුට නොයැවූ රු.59,668 ක් වටිනා මෙට්‍රික් ටොන් 05ක ලුණු තොගයක් 2016 මාර්තු 31 දිනට පැවැති අවසාන තොගයට ඇතුළත්ව තිබුණි. මේ නිසා

සමාලෝචිත වර්ෂයේ තොගය සහ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. තවද, අවසන් තොගයේ වටිනාකම ලෙස තොගවල පොත් අගය ගෙන තිබූ අතර මේ හේතුවෙන් භෞතික තොගය සහ පොත් අගය අතර මෙට්‍රික් ටොන් 62.289 ක් හෙවත් රු.743,331 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස අවසන් තොගය සහ සමාලෝචිත වර්ෂය සඳහා ලාභය රු.743,331 කින් අඩුවෙන් පෙන්වා තිබුණි.

(ඇ) එලිෆන්ට් පාස්වල නව කර්මාන්ත ශාලාවක් (ලුණු ක්ෂේත්‍රයේ) ස්ථාපිත කිරීම වෙනුවෙන් දැරූ රු.3,303,491 ක මූලික වියදම් ප්‍රාග්ධනිත නොකර සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ආදායමට එරෙහිව අයකර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කරන ලද මතය සඳහා පදනම ඡේදයේ පැහැදිලි කරන ලද කරුණුවලින් විය හැකි බලපෑම හැරුණු විට මාගේ මතය වනුයේ, සී/ස මාන්තායි සෝල්ට් සමාගමේ 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස පිළිඹිබු කර ඇති බවත්, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බවත්ය.

### 2.2.1 අනෙකුත් නීතිමය හා නියාමන අවශ්‍යතා මත වාර්තා

-----------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ නියමය පරිදි, පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

(ආ) මාගේ මතය වනුයේ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව ඉදිරිපත් කර ඇති බවත්ය.

### 2.2 නොසැසඳු වෙනස්කම්

---------------------------

මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබූ ශේෂ සහ උත්සව අත්තිකාරම් උපලේඛන අතර රු.114,750 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

**පහත සඳහන් නීති, රීති,හා රෙගුලාසිවලට අනුකූල නොවීම නිරීක්ෂණය විය.**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| 2015 මැයි 25 දිනැති අංක PED/1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | රාජකාරී වාහනයක් පවරා එය භාවිතා කරමින් තිබියදී චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සමාගමේ සභාපතිවරයා ප්‍රවාහන දීමනා ලෙස රු.290,000 ක් ලබාගෙන තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ අතිරික්තය රු.275,429 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ අතිරික්තය වූ රු.4,457,567 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,182,138 ක හෙවත් සියයට 94 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පිරිවැටුම රු.13,352,058 කින් හෙවත් සියයට 27 කින් ඉහළ ගොස් තිබුණද විකුණුම් පිරිවැය රු.21,356,921 කින් ඉහළ යාම මෙම පිරිහීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකය විය.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සහ පසුගිය වර්ෂ 02 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී මූල්‍ය ප්‍රතිඵලයේ අඛණ්ඩ පහත වැටීමක් පෙන්නුම් කෙරිණි.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 03 ක වැදගත් අනුපාත කිහිපයක් පහතින් දක්වා ඇත.

| විස්තරය | 2015/2016 | 2014/2015 | 2013/2014 | 2012/2013 |
| --- | --- | --- | --- | --- |
| දළ ලාභ අනුපාතය | 21.15 | 43.24 | 26.04 | 34.30 |
| ශුද්ධ ලාභ අනුපාතය | 0.44 | 9.09 | 15.91 | 1.29 |
| වත්කම් මත ප්‍රතිලාභ | 0.41 | 7.25 | 10.67 | 0.01 |
| යෙදවුම් ප්‍රාග්ධනය සඳහා ප්‍රතිලාභ | 0.68 | 6.84 | 7.09 | 0.39 |
| ජංගම අනුපාතය | 2.14 | 4.44 | 14.23 | 3.89 |
| ක්ෂණික අනුපාතය | 1.64 | 1.00 | 5.64 | 1.98 |

(i) නිෂ්පාදිතවල විකුණුම් පිරිවැය ඉහළ යාම හේතුවෙන් පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 51 කින් පහත වැටී තිබුණි.

(ii) ශුද්ධ ලාභ අනුපාතය සියයට 9.09 සිට සියයට 0.44 දක්වා පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී උග්‍ර ලෙස පහත වැටීමකට ලක්වී තිබුණි.

(iii) යෙදවූ ප්‍රාග්ධනයේ සෑම රුපියලක් සඳහා වූ ඉපැයූ ලාභ අනුපාතය (Profit earned by each rupees of employed capital - ROCE) සියයට 6.84 සිට සියයට 0.68 දක්වා හදිසි ලෙස අඩු වී තිබුණි. මෙමගින් ආයෝජනය කරනු ලබන සෑම රුපියලකින්ම ශත 0.68 ක ලාභයක් පමණක් සමාගම උපයන බව නිරූපනය කෙරිණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්**

2016 නොවැම්බර් 11 දින අනතුරට පත් වූ මෝටර් රථයේ ඇස්තමේන්තුගත හානිය රු.මිලියන 2.5 ක් වුවද, වාහනය අලුත්වැඩියා කිරීම සහ මූලික විමර්ශනයන් පවත්වා විගණනයට වාර්තා නොකර ටොයෝටා සමාගමේ ගරාජයේ තබා තිබුණි.

**4.2 අනාර්ථික ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී සමාගමට බඳවා ගෙන තිබූ විධායක අධ්‍යක්ෂවරයා සමාගමේ කටයුතුවලට සම්බන්ධ වී නොතිබුණු නමුත් ඔහුට මාසික දීමනා ලෙස එකතුව රු.884,425 ක මුදලක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු.453,198 ක් අනියම් කම්කරුවෙකුට ගෙවා තිබුණත් ඔහු විසින් සමාගමේ කටයුතුවලට සම්බන්ධ වී නොතිබුණු අතර ඔහුගේ නමද කම්කරු මාසික චෙක් රෝලෙහි ඇතුළත් කර නොතිබිණි.

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාර මූල්‍ය වර්ෂය අවසන් වි දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනයට ඉදිරිපත් කළ යුතුය.එසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2017 සැප්තැම්බර් 22 දින දීය.

**5.2 අභ්‍යන්තර විගණන කාර්යයන්**

සමාලෝචිත වර්ෂයේදී මන්නාරම හා එලිෆන්ට්පාස්වල පිහිටි ලුනුලේවා කර්මාන්තශාලාවන්හි අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර නොතිබුණි.

**5.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්**

2009 ජුනි 9 දිනැති අංක DMA/2009(I) මගින් සංශෝධිත 2016 ජනවාරි 28 දිනැති අංක DMA/Cir-edit/2016 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව පැවැත්විය යුතු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව පවත්වා නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනය අතරතුරදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (i) | තොග කළමනාකරණය | භෞතික සත්‍යාපනයේදී උද්ගත වූ තොගවල වෙනස්කම් පිළිබඳ සැලකිලිමත් නොවී අවසන් තොගවල වටිනාකම දක්වා තිබුණි. |
| (ii) | මිල තීරණය කිරීම | මිල වෙනස් කිරීමේ තීරණ ගැනීමේදි සැලකිය යුතු තීරණ සඳහා එළඹීමකින් තොරව ස්වේච්ඡාවෙන් ගැනීම. |
| (iii) | ආදායම හඳුනාගැනීම | පොලී ආදායම් හා අනෙකුත් ආදායම් හඳුනා ගැනීමේ සමානත්වයක් දක්නට නොලැබීම. |
| (iv) | මූල්‍ය පාලනය | ආයෝජන අරමුණු සඳහා උපයෝජනය නොකර වර්ෂාවසාන අතිරික්ත ශේෂයන් පවත්වා ගෙන යාම. |
| (v) | ලේඛන පවත්වාගැනිම | ස්ථාවර වත්කම් ලේඛනය නිසි පරිදි පවත්වා නොතිබුණි. |